# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1799/15 - 2013 මාර්තු මස 01 වැනි සිකුරාදා - 2013.03.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනු ව්‍යවස්ථාව සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

**මහින්ද රාජපක්ෂ,**
ජනාධිපති.

2013 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2013 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.
2. පහත උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ 2013 පෙබරවාරි මස 28 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට බලපවත්වන පරිදි කිසිම තැනැත්තෙකු විසින් කිසිම රටකින් ශ්‍රී ලංකාවට ආනයනය කරනු නොලැබිය යුතු ය.

**උපලේඛනය**

| *Iවැනි තීරය සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* | *IIවැනි තීරය සංයෝජිත වර්ගීකරණ සංකේතය* | *III වැනි තීරය විස්තරය* |
|---|---|---|
| 22.07 | | පරිමාව අනුව මද්‍යසාර සැර ප්‍රමාණයෙන් 80% ක හෝ ඊට වැඩි මද්‍යසාර ප්‍රමාණයක් ඇති ස්වභාවය වෙනස් නොකළ ඊතයිල් මද්‍යසාරය, කවර සැර ප්‍රමාණයකින් හෝ ස්වභාවය වෙනස් කළ ඊතයිල් මද්‍යසාරය සහ අනෙකුත් ස්ප්‍රීතු වර්ග |
| | 2207.10 | පරිමාව අනුව මද්‍යසාර සැර ප්‍රමාණයෙන් 80% ක හෝ ඊට වැඩි මද්‍යසාර ප්‍රමාණයකින් යුත් ස්වභාවය වෙනස් නොකළ ඊතයිල් මද්‍යසාරය |
| | 2207.20.10 | සුරාබදු ආඥාපනත යටතේ පනවන ලද රෙගුලාසි අනුව ස්වභාවය වෙනස් කළ ස්ප්‍රීතු |
| | 2207.20.90 | අනෙකුත් |

03-659


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 017356— 340 (2013/03)

*මෙම ගැසට් පත්‍රය* www. documents.gov. lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*